# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2460/03 - 2025 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාදා - 2025.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 09/03/01/2022/04.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමුව:* 4-3/9/2021/PC/418.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 50 බලගල්ල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බලගල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද 2025.09.16 දිනැති කඩඉම් සිතියම් අංක 510006 (කලාප 7) හා පත්‍රය 17 හි කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.4060 ක් වූ පහත සඳහන් ඉඩම.

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: වැරැල්ලගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත; ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව: ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා; හිමිකම් කියන්නා: ජයකොඩි ආරච්චිගේ කිත්සිරි ජයකොඩි; ප්‍රමාණය: හෙක්. 0.4060.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 නොවැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඩබ්.ඩබ්.එම්.ඩී.කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය කොට්ඨාසය.

2025 ඔක්තෝබර් මස 24 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-256


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*